


**ශ්‍රී. බු. ව. 2558 ක්වූ උඳුවප් මස කලාපය, රා. ව. 2014 ක්වූ දෙසැම්බර් මස 06 වන දින**

**මාතර, ශ්‍රී සුදර්ශි විද්‍යායතන නියෝජ්‍ය පරිවෙණාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති**

**ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

# සත්‍යවාදීව සියලු අභියෝග ජයගනිමු.

**ගරු ස්වාමීන් වහන්ස, පින්වත්නි,**

**එකං ධමමං අතීතසස - මුසාවාදිසස ජනතුනො**

**විතිණණ පරලොකසස - නතථි පාපං අකාරියං**

**(ධමම පදය - ලොක වගග)**

**"එකම ධර්මය වූ සත්‍යය ඉක්මවා, බොරු කියන, පරලොව ගැන හැඟීමක් නැති පුද්ගලයාට නොකළ හැකි පාපයක් නැත."**

**අද උඳුවප් පුර පසළොස්වක පොහොය දිනයයි. මිහිඳු මහ රහතන් වහන්සේගේ උපදෙස් පරිදි දේවානම් පියතිස්ස මහරජතුමාගේ ආරාධනයෙන් සංඝමිත්තා තෙරණිය ශ්‍රී**

ලංකාවට වැඩම කළේ අද වැනි පොහොය දිනයකය. ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දකුණු ශාඛාව වැඩමවා අනුරාධපුර මහ මෙව්නා උයනේ රෝපණය කිරීම, ලංකාවේ භික්ෂුණී සාසනය ඇතිකරවීම යන වැදගත් කරුණු රාශියක් සිදුවූයේ අද වැනි පුර පසළොස්වක පොහොය දිනයකය. මෙවන් පොහොය දිනයක මෙම සදහම් පණිවිඩයෙන් අපේක්ෂා කරන්නේ සත්‍යවාදීව කටයුතු කළ හොත් සියළු අභියෝග ජයගැනීමේ හැකියාව ඇතිබව පෙන්වා දීමටයි.

බුදුන් වහන්සේ යනු සත්‍යවාදීත්වයේ ප්‍රතිමූර්තියයි. ඒ නිසා බුදුන් වහන්සේට තථාගත යන නම ව්‍යවහාර කෙරේ. අංගුත්තර නිකායේ ලෝක සූත්‍රයෙහි මෙසේ සඳහන් වේ. ''මහණෙනි, තථාගතයන් වහන්සේ යම්සේ කියන සේක්ද, එසේ ක්‍රියාකරන සේක. යම්සේ ක්‍රියාකරන සේක්ද එසේ කියන සේක.'' මෙසේ යථාවාදී තථාකාරී තථාකාරී තථාවාදී වන බැවින් තථාගත යයි කියනු ලැබේ. මෙම සත්‍යවාදී ගුණය බුදුන් වහන්සේට පැමිණි සෑම අභියෝගයකටම පිළිතුරු සැපයූහ.

සත්‍ය අවබෝධ කරගත් තථාගතයන් වහන්සේ මුලින්ම වැඩම කළේ බරණැස ඉසිපතන නම්වූ මිගදායෙහි ජීවත් වූ පස්වග තව්සන් හමුවීමටයි. තමා සත්‍ය අවබෝධ කරගත් බවත් ඒ ධර්මය ඔබලාට පැවසීමට පැමිණි බවත්, දේශනා කළ විට පස්වග තවුසන් බුදුන් වහන්සේගේ සර්වඥ බව නොපිළිගත්හ. තෙවරක්ම මෙසේ ප්‍රතික්ෂේප කළහ. මෙය තථාගතයන් වහන්සේට ඉදිරිපත් වූ මුල්ම අභියෝගයයි. එම අභියෝගය ජය ගත්තේ සත්‍යවාදී බව තුළිනි. එහිදී බුදුන් වහන්සේ පස්වග තවුසන්ගෙන් මෙසේ අසයි.

''මහණෙනි, මින් පෙර මම රහත්මි. මම සම්මා සම්බුද්ධ වෙමියි කියා මෙබඳු වචනයක් කියන ලදැයි තෙපි දන්නෙහුද?''

''අභිජානාථ මෙ නො තුමෙහ භිකඛවෙ ඉතො පුබෙබ එවරූපං භාසිත මෙ තනති?'' එවිට පස්වග තවුසන් කියා සිටියේ නැත ස්වාමීනි කියාය. මහා වගග පාලියේ මහා ඛණ්ඩකයේ එන මේ අදහසින් පැහැදිලිවන්නේ සත්‍යවාදී බව තුළින් ඕනෑම අභියෝගයක් ජයගත හැකි බවයි.

බුදුන්වහන්සේගේ සත්‍යවාදී ජීවිතය හඳුනාගත් අය බෞද්ධ ශ්‍රාවකයින් බවට පත්වීම සෙසු ආගමිකයින්ට ප්‍රශ්නයක් විය. අන්‍ය ආගමිකයින් ලාභ සත්කාර වලින් පිරිහෙන විට තථාගතයන් වහන්සේට විවිධ අභියෝග ඉදිරිපත් කළහ. ධම්ම පදයේ ලෝකවර්ගයේ එන අප මුලින් සඳහන් කළ ගාථා ධර්මයද එවැනි අභියෝගයක ප්‍රතිඵලයකි. අන්‍ය තීර්ථකයෝ ලාභ සත්කාරවලින් පිරිහෙන විට ඔවුන් උපායක් යෙදීය. චිඤ්චිමානවිකා නම්වූ රූමත් කාන්තාවක් යොදවාගෙන බුදුන්වහන්සේට අභූත චෝදනාවක් ඉදිරිපත් කළහ. ජේතවනාරාමයට නිතර ගිය මැය දරුවෙක් ලැබීමට සිටින මවක් සේ ඇවිත් බුදුන් වහන්සේ බණ දේශනා කරන තැන ඉඳගෙන මෙසේ කියයි. මම දැන් ගර්භනී මාතාවක් වෙමි. මේ දරුවාගේ පියා හැටියට මේ වේලාවේදී බණ දේශනා කිරීම ප්‍රමාණවත් නොවේ. මට අවශ්‍ය

දේ සම්පාදනය කළ යුතුයි. තම උපාසක උපාසිකාවන් ඉදිරියේ ලැබුණු මෙම චෝදනාව මහත් අභියෝගයකි. එය ජයගත්තේ සත්‍යවාදී ජීවිතය තුළිනි. "පරිබ්‍රාජිකාවනි තී කියන කථාවේ සැබෑ බොරු තීත් මමත් දනිමු. අන්හු නොදනිත්. සුළු වේලාවකින් මැයගේ අසත්‍යය හෙළි විය. බණ පොතේ කියන්නේ මැය පොළොව පළාගෙන නිරයට ඇදගෙන ගිය බවයි. මෙම අවස්ථාවේදී බුදුන් වහන්සේ දේශනා කළේ එකම ධර්මය වූ සත්‍ය ඉක්මවා බොරු කියා, පරලොව ගැන හැඟීමක් නැති අයට කළ නොහැකි පාපකර්මයක් නොමැති බවයි.

තථාගතයන් වහන්සේ බෝධිසත්ව අවදියේද සත්‍යවාදී බව නිසා අභියෝග ජයගත් බව ජාතක සාහිත්‍යයෙන් පෙනේ. අප මහ බෝසතාණෝ හාරිත තාපස නමින් පඤ්චාභිඥා අෂ්ඨ සමාපත්ති ලබාගෙන ජීවත් විය. රජතුමාගේ මාලිගය ආසන්නයේ ජීවත් වූ මෙම හාරිත තාපස තුමාට සියළු උවටැන් කළේ රජතුමාය. ප්‍රාන්ත රාජ්‍යයක කැරැල්ලක් සන්සිඳවීමට යායුතු බැවින් තම දේවියට කියා තාපසතුමාට උවටැන් කරන ලෙස පවරා ඒ ගමන ගියහ. මේ අතර හාරිත තාපසතුමා කෙලශ වසඟ වී දේවිය සමග අඹුසැමියන් ලෙස ජීවත් විය. මේ බව රජතුමා දැනගත්තද විශ්වාස නොකළහ. පසුව බිසවගෙන් ඇසූ විට එය සත්‍යයක් බව පැවසීය. රජතුමා එය ද නොපිළිගෙන තාපසතුමාගෙන් විමසූහ. මෙහිදී හාරිත තාපස තුමා විශාල අභියෝගයකට මුහුණ දුන්හ. එහිදී තාපසතුමා කියා සිටියේ රජතුමනි, මම මේ දිග සසර තුළ සතුන් මැරුවෙමි. සොරකම් කළෙමි. කාමයන්හි වරදවා හැසුරුණෙමි. සුරාපානය කළෙමි. නමුත් මම කිසිදාක බොරුවක් නොකීවෙමි. ඒ නිසා මම කෙළෙස් වසඟවීම නිසා මේ තත්වයට පත් උනායයි කීහ. රජතුමා මෙහිදී කලබල වූයේ නැත. හාරිත තාපසතුමාගේ සත්‍ය වචනය ගැන පැහැදී එතුමාට උපදෙස් දුන්නේ ඔබතුමා නැවතත් පෙර සිටි ආකාරයට පත්වීමට කටයුතු කරන ලෙසයි.

වට්ටක ජාතකයෙහි අප මහ බෝසතාණන් වහන්සේ වටු කුලයක ඉපිද කූඩුවක වාසය කරයි. මේ කූඩුව තිබෙන මහ වනයේ ලැව් ගින්නක් හටගත්හ. පියාසර කළ හැකි සියලූ සතුන් බේරී පළා ගියහ. බෝසතාණන් වහන්සේගේ දෙමාපියන්ද වෙන කළ හැකි දෙයක් නැති නිසා පලා ගියහ. මෙය බෝසතාණන් වහන්සේ මුහුණ පෑ බරපතල අභියෝගයකි. හාත්පසින්ම ගිනි ජාලාවෝ තමා වෙත එයි. බෝසතාණන් වහන්සේ මෙසේ සත්‍යක්‍රියා කළ සේක. "මාගේ පියාපත් විහිදුවාගෙන මට පියාසර කළ නොහැක. අත් පා ඇතත් ඒවා ඔසවාගෙන යා නොහැක. මේ සියල්ල සත්‍යය. ඒ සත්‍ය බලයෙන් මේ ගින්න නිවේවා" ජාතක පොතේ එන වට්ටක ජාතකයෙහි සඳහන් කරන්නේ එම ගින්න නිවී ගොස් බෝසත් වටුපැටවාගේ ජීවිතය බේරුණු බවයි.

සාම ජාතකයේදී අප මහා බෝසතාණන් වහන්සේ තම අඳ දෙමාපියන් රක්‍ෂා කරමින් ජීවත් වෙයි. දිනක් පැන්ගෙන ඒමට ගිය අවස්ථාවේ මුව දඩයමේ ගිය පිළියක් නම් රජුගේ ඊ පහරකට ලක්වී බිම ඇද වැටිනි. මේ බෝසතාණන් වහන්සේගේ ජීවිතයට එළඹි ප්‍රබල අභියෝගයකි. මෙහිදී සාම කුමාරයාගේ දෙමාපියන් සත්‍ය ක්‍රියාවක් කළහ. "මාගේ පුතණු වූ සාම කුමරුන් උපන් තැන් පටන් ජීවිතාන්තය දක්වාම අඛණ්ඩව බ්‍රහ්මචර්යාව ආරක්ෂා

කළහ. අඛණ්ඩව අෂ්ඨාංග සීලය ආරක්ෂා කළහ. නිවන් දක්නා ජාති දක්වා බුද්ධාදී රත්නත්‍රය හැර වෙන සරණක් නොපැතුහ. නිරන්තරයෙන්ම ත්‍රිලක්ෂණ භාවනාවෙන් කල් ගෙවූහ. මේ සියල්ල සත්‍යය. මේ තුළින් මගේ පුතා සුවපත් වේවායි ප්‍රාර්ථනා කළහ. සාම ජාතකය සඳහන් කරන පරිදි සාම කුමරු සුවපත් වූ බවත් අඳ මාපියෝ ඇස් ලැබ සුවපත් වූ බවත් කියයි.

සම්බුලා ජාතකයේදී සම්බුලා දේවිය තම ස්වාමිපුත්‍රයා වූ සොත්ථිසේන රජතුමා සමග ඉතා සමගියෙන් ජීවත් විය. රජතුමාගේ ශරීරයෙහි ඇතිවූ කුෂ්ඨ රෝගය සුවපත් කර ගැනීමට නොහැකි වූ නිසා රජකම අතහැර කැලයට යාමට තීරණය කරයි. එහිදී සම්බුලා දේවියද රජ සැපත අත්හැර දමා කැලයට ගොස් පලවැල ගෙනවුත් සොත්ථිසේන රජු පෝෂණය කළාය. දිනක් පලවැල නෙලීමට ගිය දිනෙක දානව නම් රකුසෙකුගේ කරදරයට ලක්ව ප්‍රමාද වී එනවිට සොත්ථිසේන රජු අසපුවේ නොසිටියහ. එහිදී සම්බුලා දේවිය හඬන්නට පටන් ගත්තාය. ටික වේලාවකින් සොත්ථිසේන රජු එතනට පැමිණ බිසවට තදින් දෝෂාරෝපණය කළහ. මෙය සම්බුලා දේවියට ඇතිවූ ප්‍රබල අභියෝගයකි. එහිදී ඇයට පිහිට වූයේ සත්‍ය ක්‍රියා බලයයි.

''මා එලාඵල ඇරගෙන එන වේලෙහි ඒ දානව රාක්ෂයා අවුත් මා අත අල්වාගෙන සිට මෙලෙස කීයේද, එකල්හි මාගේ යැදීමෙන් සක් දෙව් රජ අවුත් මා ගලවා ගියේයැයි යම් වචනයක් කීම්ද, ඒ මා කී බස් ඒකාන්තයෙන් සත්‍ය වී නම් ඒ සැබෑ වචනය දැනුත් මා රක්නේය. පරලොවිනුත් ගලවන්නේය. නුඹ වහන්සේ ඇර මට ප්‍රිය වූ අන් පුරුෂයෙකු නොදනිමි. මේ සත්‍ය වචනය බලයෙන් පඤ්ච වෛi කුලයා විසින් පිළියම් කළ නුහුදු මේ අසාධ්‍ය රෝගය සුවවේවායි සිතා පැන් කළයක් ගෙන රජුගේ හිස මත වත් කළහ. එවිට රජුගේ කුෂ්ඨ රෝගය සුවපත් වූ බව සම්බුලා ජාතකය සඳහන් කරයි.

අංගුලිමාල හිමියන් පිණ්ඩපාතයෙහි වඩිනා විට එක්තරා ගර්භනී මාතාවක වේදනාවෙන් සිටිමින් පිළිසරණක් පැතුහ. එය අංගුලිමාල හිමියන්ට ඉදිරිපත් වූ අභියෝගයකි. එහිදී ඒ හිමියන් ප්‍රකාශ කළේ ''නැගණියනි, මම ආර්ය ජාතියෙහි උපන් පසු කිසිවිටෙකත් දැන දැන සතෙකුගේ ජීවිතය තොර නොකෙළෙමි. එය සත්‍යයකි. ඒ සත්‍යයේ බලයෙන් මේ ගර්භනී මාතාව සුවපත් වේවා'' මෙම සත්‍ය ක්‍රියාවේ බලයෙන් එතුමිය සුවපත් වූ බව අංගුලිමාල සූත්‍රය කියයි.

සිංහල රාජාවලියේ ජීවත් වූ සිරි සඟබෝ රජතුමාද දැහැමි පාලකයෙකි. වර්තමාන කාලයේ පාලකයින්ගේ උසස් බව මනිනා මිනුම් දඬු වලට අනුව නම් එතුමා ශ්‍රේෂ්ඨ පාලකයෙකු නොවේ. එතුමා රණශූරයෙකු වශයෙන් රටට කීර්තියක් ලබාදුන් රාජ්‍ය පාලකයෙකු ද නොවේ. එතුමා ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස සලකන්නේ භාරතයේ චින්තනයට අනුව යුද්ධවීර, දානවීර, ධර්මවීර යන තුනෙන් අන්තිම වර්ගයට අයත් වූ නිසාය. පඤ්චසීල ප්‍රතිපත්තිය අනුව යමින් ක්‍රියාකල සිරිසඟබෝ රජතුමාට තම පාලන කාලය තුළ ප්‍රබල

අභියෝග රාශියකට මුහුණ දීමට සිදුවිය. නපුරු නියඟයකින් ජනතාව පීඩනයට පත්ව සිටි මොහොතක එතුමා සත්‍ය ග්‍රහයක යෙදී වැසි වස්සවා රටේ ජනතාව ප්‍රීණනය කළහ. රාක්ෂ උවදුරක් පැමිණි අවස්ථාවේදී අෂ්ඨාංග උපෝසථ සීලය සමාදන් වී රකුසා තමා වෙත ගෙන්වාගෙන එම උවදුර නැති කළහ. රටේ සොර සතුරු බිය ඇතිවූ විට දැහැමි ක්‍රම අනුගමනය කොට ඒවා නැති කළහ. තමනට අයිතිව තිබූ රජකම පැහැර ගැනීමට ගෝඨාභය කුමරු සූදානම් වූ විට රජකම ඔහුට දී වනගත විය. තමාගේ හිස ගෙනැවිත් දුන් කෙනෙකුට දහසින් බැඳි පියලි දෙන බවට ගෝඨාභය රජු ප්‍රකාශ කල බව දැනගෙන දුගියෙකුට තම හිසද පරිත්‍යාග කළහ. සිරි සඟබෝ රජතුමා තමාට ඉදිරිපත් වූ සෑම අභියෝගයක්ම ජයගත්තේ සත්‍යයේ බලයෙනි.

මේ සියලු කරුණු සම්බන්ධ කරගෙන සත්‍යවාදීව ක්‍රියා කළොත් අපේ ජීවිත වලට එන සියලු අභියෝග මැඩගෙන ක්‍රියා කළ හැක. නමුත් නූතනයේ බොහෝ විට ගිහි පැවිදි බොහෝ චරිත තුළ ප්‍රදර්ශනය වන්නේ බොරුවකි. කහපාටින් හා සුදු පාටින් වසා ගත් බොහෝ දෙනා තුළ එම කහපාට හෝ සුදුපාට නැත. ජනතාව මුලා කරමින් කටයුතු කරන ඔවුන්ට තම ජීවිතයේ එන අභියෝග ජයගත නොහැක. එහිදී අපේ බොහෝ දෙනා අද යොදා ගන්නේ බෝධි පූජා පිරිත් දේශනා පවත්වා ආශිර්වාද ලබා ගැනීමයි. නමුත් එම ආශිර්වාද ඔවුන්ට ලැබෙන්නේ නැත. සම්බුලා දේවියට රකුසාගෙන් කරදර වූ විට ශක්‍රදේවේන්ද්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උණු විය. අද එසේ උණු නොවන්නේ ඇයි? අද විවාහ ජීවිත ගත කරන බොහෝ දෙනාගේ ජීවිත බොරුව නිසා බිඳී ගොස්ය. එම නිසා උදේ පටන් රෑ වනතුරු අභියෝග රාශියකට මුහුණ දෙමින් අසහනයෙන් ජීවත් වෙති. ඒවාට පිළියම් වශයෙන් තව තවත් රටට ණය වී ශාන්ති කර්ම කරගනී. ඒ කිසිවකින් පිහිටක් නොලැබ අසහනයෙන්ම මිය පරලොව යන්නට සිදුවේ.

අද රටට සිදුවී ඇති දේ ගැනද කල්පනා කර බැලුවොත් පෙනී යන්නේ බොරුවෙන් සිදුවූ ප්‍රතිඵලයකට මුහුණ දීමට සිදුවී ඇති බවයි. සිරිසඟබෝ වැනි චරිත තිබුණානම් මෙවැනි ප්‍රතිඵල උදා නොවනු ඇත. රජයේ මුදල් වලට තිබෙන කෑදරකම නිසා බොහෝ දෙනා කරන බොරු වැඩ ගැන සැලකිලිමත් විය යුතුයි. රජයේ මුදල් කියා කියන්නේ ජනාධිපතිතුමාගේ මුදල් නොවේ. රටේ ජනතාව පාලකයා වෙත දෙනු ලබන බදු මුදල්ය. විදුලිය, ජලය, දුරකථන වැනි දේ සඳහා ජනතාව බදු ගෙවන්නේ සතුටු සිතින් නොවේ. ඉතා අමාරුවෙන් ගෙවන බදු මුදලෙනි රජයේ සේවකයින්ට වේතනය ගෙවන්නේ. එසේනම් එම වේතනය ලබමින් බොරු කරන අයට කාගේ පිහිටක්ද? ඔවුන්ට හිමිවන්නේ සදාකාලිකවම අසහනයෙන් ජීවත් වීමටයි. එවැනි බොරුකාරයින් සිටිනා තුරු අපේ රට සංවර්ධනය කළ නොහැක. වර්ෂය අවසාන වන විට බොහෝදෙනා යුහුසුළුව කටයුතු කරති. රජයේ මුදල් ටික කෙසේ හෝ වියදම් කළ යුතුයි. නැතිනම් ලබන අවුරුද්දේ මුදල් ලැබෙන්නේ නැතිලු. ඒ නිසා ගමේ ගොඩේ කියන හැටියට හතරවරං ගසා එම මුදල් වියදම් කරති. මේ බොරුව කවදා කෙළවර වේද? තම තමන්ගේ තනතුර අනුව තම තම නැණ පමණින් රජයේ දේපල විනාශ කරති. මෙවැනි බොරු කරන අයට පරලොව ගැන හැඟුමක් නැත. ඒ නිසා ලැජ්ජා

නැතිව භය නැතිව හැම අපරාධයක්ම කරති. නමුත් ධර්මානුකූල ජීවිත ගත කරන අය ඉහත කී ක්‍රම අනුගමනය නොකොට සත්‍යවාදීව කටයුතු කරමින් තමා ඉදිරියට එන සියලු අභියෝග ජයගනී. බෞද්ධයාට තිබෙන ලොකුම අභියෝගය සසර දිගු විමයි